# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

### ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණය සහ විද්‍යාවේ දී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම 2023/2024 අධ්‍යයන වර්ෂය

2023/2024 අධ්‍යයන වර්ෂයෙන් ආරම්භ කරනු ලබන පහත සඳහන් පාඨමාලා හැදෑරීම පිණිස ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත්කර ගැනීම සඳහා ඉංග්‍රීසි විෂය සහිතව සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් රජයේ හෝ රජයේ අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල හෝ සේවය කරන ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

i. කලා උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි විෂය සහිත),
ii. විද්‍යාවේදී උපාධි පාඨමාලාව (ජෛවීය විද්‍යා/භෞතික විද්‍යා/ව්‍යවහාරික විද්‍යා).

02. ඉල්ලුම්කරුවන් මේ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි :

I. (අ) කලා පාඨමාලාවට අයදුම් කිරීම සඳහා,

2019 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයක දී *හෝ* ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණය සමත් ව තිබීම;

(ආ) ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා *හෝ* ව්‍යවහාරික විද්‍යා හෝ යන පාඨමාලාවට අයදුම් කිරීම සඳහා, 2019 වර්ෂයේ *හෝ* ඊට පසු පැවැත් වූ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත්ව තිබීම.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගුරුවරයෙකු වශයෙන් අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර අදාළ ගුරු පත්වීම ස්ථිර කර තිබීම.

iii. තෝරාගනු ලබන අවස්ථාවේ දී ගුරු අභ්‍යාස විද්‍යාලයක, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක, විශ්වවිද්‍යාලයක *හෝ* ජාතික අධ්‍යාපන ආයතනයේ *හෝ* උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටීම.

iv. යම් විශ්වවිද්‍යාලයක පවත්නා ජෛවීය විද්‍යා, භෞතික විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා හෝ පාඨමාලාවක් සම්බන්ධයෙන් වූ විට, අදාළ පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී *හෝ* විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේ දී හෝ අදාළ විශ්වවිද්‍යාලය විසින් පූර්ව අවශ්‍යතාවයක් ලෙස දක්වනු ලබන විෂයයන් සඳහා සාමාර්ථ ලබා තිබීම.

v. පූර්ණ කාලීන වැටුප් සහිත අධ්‍යයන නිවාඩු හිමිකම ඇති ගුරුවරයෙක් වීම.

03. රජයේ ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් අදාළ පාසලේ විදුහල්පති/ කළමනාකරු විසින් ද සහතික කළ යුතුය.

04. රජය අනුමත කරන පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන් විසින් අනුමත කරන අයදුම්පත්වල එම පාසලේ විදුහල්පති/කළමනාකරු විසින් අදාළ ගුරුවරයා/ගුරුවරිය සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි/නොහැකි බව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

05. සෑම අයදුම්පතක් ම මෙහි සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට පිටපත් දෙකකින් (02) යුතුව සකස් කර **2024.10.25 දිනට පෙර "අධ්‍යාපන අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන ශාඛාව, අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා අයදුම්පත් 2023/2024 (ගුරුභවතුන් සඳහා)"** යනුවෙන් සඳහන් කළ යුතුය.

06. මෙම ප්‍රවේශය යටතේ සිසුන් තෝරාගනු ලබනුයේ ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණයේ දී/ ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණයේ දී හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේ දී හෝ ලබාගත් මුළු ලකුණු

අදාළ විෂයට ලබාගත් ලකුණු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු පදනම් කර ගනිමිනි.

07. වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට ඇති හිමිකම් පිළිබඳව සම්මුඛ පරීක්ෂණයේ දී විමසා බලනු ලැබේ.

08. උපාධි ලබා ගැනීමෙන් අනතුරුව උපාධි ගුරු පත්වීම් ලබාදීම පිළිබඳව වගකීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

අයදුම් පත්‍රය, මාධ්‍යය තුනෙන් ම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ (www.moe.gov.lk.) විශේෂ දැන්වීම් තීරයේ පළ කර ඇත.

09. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් හෝ ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජේ. එම්. තිලකා ජයසුන්දර,
ලේකම්,
අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය.

10-44